# පුංචි සරෝජා



ශනෙලි බණ්ඩාර විජේකෝන්

# පුංචි සරෝජා


## ශනෙලි බණ්ඩාර විජේකෝන්

කතෘ



පාසල : මහාමායා බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය:3 ශ්‍රේණිය C



පළමු මුද්‍රණය: 08-02-2025

ISBN අංකය: 978-624-208-277-6

# පිදුම

මාගේ **පුංචි සරෝජා** කතන්දර පොත මාගේ
ආදරණීය අයියාට සාදරයෙන්

පිළිගන්වමි.

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ි හෙරණගත්කරණීv ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



කඳු කරයේ තේ වත්තක පුංචි පවුලක් ජීවත් වුණා.එයාලා ජීවත් වුණේ තහඩු ගෙදරක.ඒ ගෙදරේ ජීවත් වුණේ අම්මායි, තාත්තායි, දුවයි.

ඒ දුවගේ නම සරෝජා. සරෝජා හරි දක්ෂ ළමයෙක්. පාසලේ වැඩ කටයුතු හොඳින් කළා.විභාගය පාස් වුණා. එයාගේ අම්මායි,තාත්තායි ගොඩක් සතුටු වුණා.



සරෝජාගේ අම්මායි, තාත්තායි වැඩ කළේ තේ වත්තේ.

අම්මා තේ දළු කැඩුවා. වත්තේ වැඩ කරලා හම්බුණ සල්ලිවලින් ජීවත් වුණා.

සරෝජාට හොඳ යාළුවෙක් හිටියා. එයාගේ නම පවිනි.

සරෝජා ජීවත් වූ වත්ත අයිති පවිනිලාට.පවිනි පාසල් ගියේ ලොකු ඉස්කෝලෙකට.



සරෝජායි,පවිනියි හැමදාම ගෙදර ඇවිලා සෙල්ලම කරනවා.පාසල් වැඩ කරනවා පවිනි සරෝජාට උදව් කරනවා. එයාට හම්බවන හැම දෙයම සරෝජාට දෙනවා.



සරෝජාට දෙමළ පුළුවන් නිසා පවිනිට කියලා දුන්නා.පවිනිට ඉංග්‍රීසි හොඳට පුළුවන් නිසා සරෝජාට කියලා දුන්නා.දෙන්නාටම භාෂා දෙකම පුළුවන්.





පවිනිගේ අම්මායි,  තාත්තායි සතුටු වුණා.ඒ  හින්දා පවිනිගේ
පාසලට සරෝජාවත් දැම්මා ඒ දෙන්නා සතුටින් පාසල් ගියා.



පවිනිගේ අම්මායි,  තාත්තායි සතුටු වුණා.ඒ  හින්දා පවිනිගේ පාසලට සරෝජාවත් දැම්මා ඒ දෙන්නා සතුටින් පාසල් ගියා.



එක් දවසක් පවිනියි,සරෝජායි පාසල් යනකොට පවිනි වැටුණා. සරෝජා පවිනිට උදව් කළා.“ඔයා හොඳ යාළුවෙක්” පවිනි කිව්වා.

පුංචි සරෝජා හා පවිනියි වගේ පුංචි අපිත් හොඳ යාළුවෝ වෙමු.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාවනූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකකසිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්